JSS 2026 4(1): 226-244

Journal of Social Sciences (JSS) - NISD
Volume 04 – Issue 01
DOI: https://doi.org/10.4038/jssnisd.v4i1.67

13

# COLOMBO-BASED ANTI-COLONIAL RESISTANCE IN SRI LANKA IN THE 16TH CENTURY

## 16 වන සියවසේ ශ්‍රී ලංකාවේ කොළඹ මුල්කරගත් යටත්විජිත විරෝධය

**H.M.S.B. Herath**

Department of History, University of Kelaniya, Sri Lanka

Email : samanh@kln.ac.lk

## ABSTRACT

*European influence on many countries in the world began with the start of the Age of Exploration in the $16^{th}$ century. The Portuguese, the first European nation to invade Sri Lanka, used both negotiations and warfare to consolidate their power along the coast. As a result, Sri Lanka became a Portuguese semi-colony. Considering the political and social structure of Sri Lanka in the $16^{th}$ century, both the ruler and the common people had a tendency to wage war with invaders. The Sītavaka kings opposed the Portuguese expansionism. The Colombo area was a major battlefield. The ability to fight against foreigners, military skill, and the use of weapons were at a significantly advanced level. Although Rājasinghe was a powerful warrior, he failed to garner sufficient local and international support against the Portuguese. If Rājasinghe had received foreign military technology and support, and the support of local rulers, it would have been a more effective strategy to expel the Portuguese from Sri Lanka. King Rājasinghe, driven by an unbridled desire to eliminate the Portuguese from the country, launched a major military campaign that abandoned the need to wage war with the Portuguese, but was unable to achieve victory. Rājasinghe, who later abandoned the need to wage war with the Portuguese, confined himself to the Kingdom of Sītavaka. Rājasinghe's land battles were successful, but his two sieges of Colombo failed because he had no way of preventing naval aid sent to the Portuguese from Goa. The Portuguese naval strength and military power were the result of long-term experimentation and a scientific renaissance. By the $16^{th}$ century, they had become accustomed to the use of artillery and gunpowder, and Sri Lankan warriors found it quite difficult to face the Portuguese in battle. Although Rājasinghe was a formidable warrior, he failed to garner sufficient local and*

*international support against the Portuguese. If Rājasinghe had had the military technology and support of local rulers, it could have been the most effective strategy to drive the Portuguese out of Sri Lanka.*

**Keywords :** Portuguese, Colony, Rājasinghe, War, Independence

**සාරසංක්ෂේපය**

දේශගවේෂණ ව්‍යාපාරය මූලික වීමෙන් ලෝකයේ බොහෝ රටවල් යුරෝපා ජාතීන්ගේ බලපෑමට ලක්වීම ආරම්භ වන්නේ 16 වන සියවසේදී ය. වෙළඳ ආක්‍රමණිකයන් ලෙස ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම යුරෝපීය ජාතිය වූ පෘතුගීසීහු මුහුදුබඩ පළාත මුල් කරගනිමින් සිය බලය තහවුරු කර ගැනීම සඳහා සාකච්ඡා ක්‍රමය මෙන් ම යුද වැදීම ද භාවිතා කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව පෘතුගීසි අර්ධ යටත්විජිතයක් බවට පත් විය. කොළඹ මුල්කර ගනිමින් සීතාවක රජවරුන්ගේ මූලිකත්වයෙන් සිදු වූ යටත්විජිත විරෝධී ක්‍රියාකාරකම්වල ස්වභාවය හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

16 වන සියවසේ ශ්‍රී ලංකාවේ පැවති දේශපාලන සහ සමාජ සැකැස්ම සැලකීමේදී ආක්‍රමණිකයන් සමග යුද වැදීමට රටේ පාලකයා මෙන් ම සමාන්‍ය ජනතාවට නැඹුරුවක් පැවතිණි. පෘතුගීසීන්ගේ ව්‍යාප්තවාදයට එරෙහිව සීතාවක රජවරු කටයුතු කළහ. එහිදී කොළඹ ප්‍රදේශය ප්‍රධාන යුද භූමියක් විය. විදේශිකයන්ට එරෙහිව සටනට පිවිසීම, සංග්‍රාමයේ දක්ෂ බව සහ අවි ආයුධ භාවිතය සැලකිය යුතු සංවර්ධිත තත්ත්වයක පැවතිණි. පෘතුගීසීන් මෙරටින් තුරන් කර දැමීමේ නොනිමි අවශ්‍යතාවෙන් පෙලුණ රාජසිංහ රජු විසින් පෘතුගීසි බලය පැවති ස්ථානයන් විනාශ කරමින් පෘතුගීසීන් කොළඹ කොටුව වටකරමින් මහා යුධ ප්‍රයාණයක් දියත් කළ ද ඉන් ජය ලැබිය නොහැකි විය. පෘතුගීසීන් සමඟ යුධ කිරීමේ අවශ්‍යතාව ඉන් අනතුරුව අතහැරි රාජසිංහ සීතාවක රාජධානියේ වාසයට සීමා විය. රාජසිංහ විසින් කළ ගොඩබිම් සටන් සාර්ථක වන්නටත් කොළඹට කළ වැටලීම් දෙක අසාර්ථක වන්නට ගෝවෙන් පෘතුගීසීන් වෙත එවූ නාවික ආධාර වැළැක්වීමට ඔහුට මගක් නොවීම හේතු විය. පෘතුගීසීන්ගේ නාවුක ශක්තිය හා යුධ බලය දිගු කාලයක් තිස්සේ කරන ලද අත්හදා බැලීම් හා විද්‍යා පුනරුදයේ ප්‍රතිඵලයක් වශයෙන් බිහි වූවකි. මොවුන් 16 වැනි සියවස වන විට කාලතුවක්කු හා වෙඩි බෙහෙත් වැනි ද්‍රව්‍ය භාවිතයට පුරුදු වී සිටීම නිසා ලාංකික රණවිරුවන්ට පෘතුගීසීන්ගේ සටන්වලට මුහුණ දීම තරමක් දුෂ්කර කටයුත්තක් විය. රාජසිංහ ප්‍රබල රණ ශූරතාවයකින් යුතු පාලකයෙකු වුව ද දේශීය විදේශීය වශයෙන් ප්‍රමාණවත් සහයෝගයක් පෘතුගීසීන්ට විරුද්ධව ලබා ගැනීමට ඔහු අපොහොසත් විය. යුධ තාක්ෂණය සහ ප්‍රාදේශීය පාලකයන්ගේ සහාය රාජසිංහට ලැබුණි නම් ශ්‍රී ලංකාවෙන් පෘතුගීසීන් නෙරපා හැරීමේ ප්‍රබලම සටන් උපක්‍රමය එය වන්නට ඉඩ තිබිණි.

**මුඛ්‍ය පද:** පෘතුගීසි, යටත්විජිතය, රාජසිංහ, යුද්ධය, නිදහස

**හැඳින්වීම**

ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා දඩයම සඳහා මෙන් ම පරිසරය සමග සටන් කිරීම අරමුණු කරගත් ක්‍රියාකාරකම්හි නිරත වූ බවට ඉඟි පළවන පුරාවිද්‍යාත්මක සාධක ලැබේ. ලක්දිව මානවයා මුලින් ම භාවිත කළ ගල් මෙවලම් සොයාගන්නා ලද්දේ පශ්චාත් ප්ලයිටෝසීන අවධියෙනි. එනම්, ක්‍රි.පූ. 10,0000 ට ආසන්න කාලයයි(රාය සහ තවත් අය, 1964 : 73). වසර 25,000 ක් පැරණි මධ්‍යම පැලියෝලිතික අවධියේ අත් පොරෝ හා සූරණ මෙවලම් භාවිත වූයේ යැයි උපකල්පනය කරණු ලබන අතර ගල් උපකරණ තැනීමේ කලාව ක්‍රමයෙන් දියුණු වූ බව සිතීමට තුඩු දෙන අනුක්‍රමික පරිණාමයක් මෙකල සිදු විය(රාය සහ තවත් අය, 1964 : 76). දකුණු ආසියාතික රටවල මානව ව්‍යාප්තිය ශ්‍රී ලංකාව කේන්ද්‍ර කරගෙන සිදු වූ බව ද ක්‍රි.පූ. 1000-900 ත් අතර කාලයේ පටන් ගන්නා යකඩ යුගයට පෙර වූ මෙගලිතික යුගයට අයත් වූ ශිෂ්ටාචාරයක් මෙරට පැවති බවට පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය ලැබී තිබේ(කරුණාරත්න, 2008 : 63). ඇඩම්ස් පෙන්වා දෙන පරිදි නව ශිලා සමයේ පසු භාගයේ ලක්වැසියන්ගේ මෙවලම් සහ ආයුධ සුලභ ය(රාය සහ තවත් අය, 1964 : 73). නව ශිලා(නියෝලිතික) එනම්, ක්‍රි.පූ. 8000 පමණ කාලයේ පොරොව, වැය වැනි දෑ දැන සිටි අතර ගල් මෙවලම් නොයෙක් ශිල්පීය ක්‍රමවලින් ඔප දැමීම, මුවහත් කිරීමාදිය සිදු කළ උපකරණ භාවිතය පිළිබඳ අවබෝධය ද පැවතිණි. කොන්ඩදෙනිය, ඉබ්බන්කටුව, පොම්පරිප්පුව වැනි එකල ස්වදේශිකයන්ගේ සොහොන් බිම්වල නිර්මාණ ක්‍රි.පූ. 5000 ට පෙර කාලයේ කළ ඒවා බව තහවුරු වේ(කරුණාරත්න, 2008 : 63). මෙරට වඩාත් වැදගත් අතීත ම යුග සටහන් කරනු ලබන බලංගොඩ, කුරගල, බෙලිගල බටදොඹ ලෙන, පාහියන්ගල, ආදී පුරාවිද්‍යාත්මක ස්ථානයන්හි කැණීම් කර මතුකර ගන්නා ලද සාධක අනුව පැහැදිලි වන්නේ මේ වාසභූමිවල සිටි ප්‍රාග් ඓතිහාසික මානවයා කිසියම් සමාජ සංස්කෘතික ක්‍රමවේදයකට හිමිකම් කියූවන් බවයි. එහෙත් ඔවුන් සතු වූ සංග්‍රාමීය තොරතුරු පිළිබඳ පැහැදිලි ප්‍රමාණවත් තොරතුරු පුරාවිද්‍යාත්මකව හෝ ඓතිහාසිකව අනාවරණය නොවේ.

මේ අනුව විජයාගමනය සිදුවන යුගයේ මෙරට ක්‍රමයෙන් වර්ධනය වී ආ දියුණු මානව සමාජයක් පැවතිණි. විජය හෙවත් සිංහලයන්ගේ සම්ප්‍රාප්තියෙන් පසුව මෙරට නිර්මාණය වන නව සමාජය තුළ සටන් සංකල්පයත්, සටන් චින්තනයත් ක්‍රමයෙන් වර්ධනය විය. ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 1848 දක්වා ශ්‍රී ලාංකිකයන් යුධ කලාවේ නිරත වීම අඩු වැඩි වශයෙන් සිදු වූවකි. ආරම්භයේ සිට ක්‍රි.ව. 1505 දක්වා මෙරටට එල්ල වූ විදේශීය ආක්‍රමණ බොහොමයක් ඉන්දියාව මුල් කරගෙන සිදු විය. එනම්, ක්‍රි.ව. 1505 තෙක් ආසියා මහාද්වීපික ජනතාවත් සමඟ ලාංකිකයෝ මුසු වූ අතර ඊට අදාළ

අත්දැකීම් ලබා ගත්හ. එහෙත් 16 වන සියවසින් පසුව මෙම පසුබිම වෙනස්ව යුරෝපා ජාතිකයන් සමඟ නව ආරක යුධ තාක්‍ෂණයක්, යුධ අවි හරඹය සඳහා ලාංකිකයෝ සිය ශක්තීන් උරගා බැලූහ. මෙම පර්යේෂණ ලිපියේ ගැටලුව වන්නේ ක්‍රි.ව. 1505 සිට ක්‍රි.ව. 1600 වන තෙක් කාලපරිච්ඡේදය තුළ ප්‍රථම යුරෝපීය ආක්‍රමණික ජාතිය වන පෘතුගීසි බලවේගයට සමානුපාතිකව සීතාවක පාලකයන් සහ ජනතාව සංග්‍රාමීය දක්ෂතා අත්හදා බැලූයේ කෙසේ ද යන්න යි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරමින් සිදු කර ඇති මෙම පර්යේෂණය ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රමය කරුණු පදනම් කරගනිමින් සිදු කර ඇත. එහිදී 16 වන සියවසේ ලංකාවේ තොරතුරු ඇතුළත් වන ප්‍රධාන පෙළේ ප්‍රාථමික මූලාශ්‍රයන්හි ඇති කරුණු නිවැරදිව තහවුරු කර ගැනීම සඳහා සංසන්දනාත්මකව විමර්ශනය කෙරිණි. විශේෂයෙන් දත්ත විශ්ලේෂණයේදී යුද අවි ආයුධ පිළිබඳ සංඛ්‍යාත්මක කරුණු සහ යුද භූමිය තුළ ලාංකිකයන් සංවිධානය වූ ආකාරය පිළිබඳ සැලකිලිමත් වූ අතර අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය මෙම පර්යේෂණයේදී භාවිත කර ඇත.

**පර්යේෂණ ලිපිය**

ධර්ම පරාක්‍රමබාහු රජු කල(ක්‍රි.ව. 1484-1513) එනම්, ක්‍රිස්තු වර්ෂයෙන් එක්වාදහස් පන්සිය විසි දෙකේ(1522) දී(රාජාවලිය, 1997 : 222-223; මහාවංසො, 2005 : 01/27) පෘතුගාලයේ සිට පැමිණි නැවක් ඉන්දියාව හරහා විත් කොලොම් තොටට ගොඩ බැසීමෙන් ලක්දිවට පැමිණි ප්‍රථම යුරෝපා ජාතිය වන පෘතුගීසීන්ගේ සම්ප්‍රාප්තිය සිදු විය. දෙදහස් අටසාළිස් වන බුදු වසෙහි මෙය සිදු වූ බව මහාවංසයේ සඳහන් වේ(මහාවංසො, 2005 : 01/22-23). දොන් ප්‍රැන්සිස්කු ද අල්මේදාගේ පුත් වූ අද්මිරාල් ලොරෙන්සෝ ද අල්මේදා ඉන්දියාවේ ගෝව නගරයේ සිට නාවික ගමනක නිරත වූ අතර ඔහු සුළු කුණාටුවකට හසුවීමේ ප්‍රතිඵලයක් ලෙස ලක්දිව ගාලු වෙරළ තීරයට සේන්දු වූ අතර එතැන් සිට කොළඹ වරායට පැමිණියේය(මහාවංසො, 2005 : 01/18-23). පෘතුගීසීන්ගේ සම්ප්‍රාප්තියත් සමඟ මෙතෙක් ශ්‍රී ලංකාවේ රජවරුන් මුහුණ නොදුන් නව ආකාරයක සතුරෙකුට මුහුණ දීම සඳහා ඓතිහාසික තීරණයක් ගැනීමට ධර්ම පරාක්‍රමබාහු රජුට සිදු විය. ධර්මපරාක්‍රමබාහුගේ පාලනයෙන් තොර වූ ගම්පොළ, මහනුවර (ශ්‍රී වර්ධන) බදුල්ල සහ යාපනය යන නගර මුල්කරගනිමින් පාලකයන් සිවු දෙනෙක් මෙකල පාලනය මෙහෙය වූහ(මහාවංසො, 2005 : 01/8-9). ඒ අනුව ධර්ම පරාක්‍රමබාහු තම සහෝදර රජුන් සිවු දෙනා, ප්‍රධාන ඇමතිවරුන් හා ඥානවන්ත ඇමතිවරුන් කැඳවා සතුරා හා සාමයෙන්

කටයුතු කරන්නේ ද යුධ වදින්නේ ද යන්න සාකච්ඡා කරනු ලැබීය. මේ සාකච්ඡාවෙන් ගත්තා වූ තීරණය ශ්‍රී ලංකාවේ ඉදිරි සියවස් කිහිපයක දේශපාලන, සාමාජීය, ආගමික හා සංස්කෘතික, ආර්ථික කාර්ය සංසිද්ධීන් නිශ්චය කිරීමේ තීරණාත්මක නිගමනයක් වූ බැවින් මෙය ශ්‍රී ලංකා ඉතිහාසයේ තීරණාත්මක හා වැදගත් ම සාකච්ඡාවක් විය. සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස චක්‍රායුධ(රාජාවලිය, 1997 : 223-224) නම් බුද්ධිමත් සෙනවියාගේ වරපුරුෂ සේවාව හරහා තොරතුරු ලබාගෙන පෘතුගීසීන් සමඟ සමඟිව විසිය යුතු බව තීරණය කොට ඔවුගෙන් පඬුරුපාක්කුඩම් ලබාගෙන, පෘතුගාල රජුට සම්මාන ලබා දී එරට හා මිත්‍රත්වයෙන් සිට කටයුතු කිරීමේ විදෙස් ප්‍රතිපතියක් ආරම්භ කරනු ලැබීය.

පෘතුගීසීහු බලය අල්ලා ගැනීමේ දක්ෂයන් වූ හෙයින් ලාංකිකයන් සමඟ කලහයෙන් තොර සමගියෙන් ක්‍රියා කරන බවට රජුට අවධාරණය කරවන්නට සමත් වූ අතර ඒ අනුව සිංහල රජු සමඟ විවිධ වූ ආකාරයෙන් පොරොන්දු පත්‍රයක් ලියාගෙන එය රැගෙන පෘතුගීසි රජු වෙත ගියහ(මහාවංසො, 2005 : 1/34-35). නැවත තෙළෙස් මසකට(මහාවංසො, 2005 : 1/34-36) පසු ලෝපෝ සෝරස් ද අල්බර් ගේරියාගේ(මහාවංසො, 2005 : 1/34-40) ප්‍රධානත්වයෙන් මෙරට කොළඹට පැමිණි පෘතුගීසීහු ලාංකිකයන් සමඟ තමන් සතුටින් වෙසෙන බව පවසා වෙළඳාම් කරමින්, මුහුදුබඩ ප්‍රදේශයේ සිටින රජුගේ සතුරන් විනාශ කරමින් අවශ්‍ය ආරක්ෂාව සැපයීම සඳහා කොළඹ වරායෙහි කොටුවක් තැනීමට බැගෑපත්ව වූ විට රජු කොළඹට පැමිණ ඔවුන්ගේ ඉල්ලීම සැක රහිත කොට අවබෝධ කොට ගෙන ඔවුන්ට එම අවසරය ලබා දුන්නේය. මේ සම්බන්ධයෙන් බියපත් වූ මුස්ලිම් ජාතිකයන් භික්ෂූන් සමඟ පැමිණ රජුට කතා කළ ද පෘතුගීසීන්ගේ කොටුව නිර්මාණය කිරීමේ කටයුතු නවත්වා ලිය නොහැකි විය. එහෙත් මුස්ලිම් ජාතිකයන් ඇතැම් සිංහලයන් ද සමඟ එකතුව ආලෝළන කළ ද පෘතුගීසීහු ඒවා තැකීමකට නොගෙන සිය යුධ හා නාවික ශක්තිය ප්‍රයෝජනයට ගෙන තම මනෝරථය සම්පූර්ණ කර ගත්හ. බොහෝ සටන් අවස්ථාහිදී පෘතුගීසීන්ගේ සන්නද්ධ ශක්තිය ඉහළ තලයක පැවතීම ඔවුන්ට වාසිදායක විය. මෙම තත්ත්වය ලාංකිකයන්ගේ යුධ මානසිකත්වය හා සටන් උපක්‍රම නව මාවතකට යොමු කිරීම කෙරෙහි බලපා තිබේ. තුවක්කු ප්‍රහාර මැඩලීමට නොව ඒවායින් බේරී ගරිල්ලා සටන් ක්‍රම මඟින් විදේශිකයන් මැඩලීමට ලාංකිකයෝ ක්‍රියා කළහ. යුධ චින්තනය සාමාන්‍ය පොදු ජනයා තුළ වර්ධනය කිරීමට යුරෝපීයයන් සතු වූ යුධ තාක්ෂණය හා දැනුම ප්‍රබල සාධකයන් ලෙස බලපා ඇති බව පැහැදිලිව හඳුනාගත හැක්කකි. 16 වන සියවසේ තුන් වන දශකයේ අවසාන භාගය වන තෙක් පෘතුගීසින්ට ශ්‍රී ලංකා දේශපාලන කටයුතුවලදී වැදගත් ස්ථානයක් නොලැබුණි. එහෙත් ඔවුන්ගේ පැමිණීම මෙරට පාලකයන්ට සහ ජනතාවට බරපතල අභියෝගයක් විය. මෙරටට පැමිණි මුස්ලිම් වෙළඳුන් සහ පෘතුගීසීන් අතර ප්‍රධාන වෙනස වුයේ පෘතුගීසීන් ආයුධ සන්නද්ධ වෙළඳ පිරිසක් වීමත් මුස්ලිම්වරුන් මෙන් අභ්‍යන්තර

වෙළඳ කටයුතුවල නිරත නොවීමත් ය. මුස්ලිම් වෙළෙඳුන්ගෙන් සහ ඔවුන් විසින් පොළඹවනු ලැබූ ලාංකිකයන්ගෙන් තර්ජන එල්ල වේ යැයි සිතූ පෘතුගීසීන් තමන්ගේ වෙළඳ ගබඩාවේ ආරක්ෂාව සඳහා ආයුධ සන්නද්ධ සොල්දාදුවන් යෙදවීය.

පෘතුගීසීහු ලාංකික රජු සමඟ පොරොන්දු ඇති කර ගත්ත ද කල්ගතවීමත් සමඟ ක්‍රමයෙන් ඒවා කඩ කරමින් කෙටි කලකින් ම රජු සමඟ උරණව යුධ කිරීම සඳහා උත්සාහ දැරූහ. පෘතුගාල රජු විසින් දොන් ජෝ ආවෝ ද සිල්වේරා සෙන්පතියා සමඟ අන්තෝ නියෝ ද මිරැන්ඩා ද, අසවේදෝ නම් කෲර ගති ඇති අද්මිරාල්වරයා සහිත යුධ සේනාවක් මෙරටට එවන ලද අතර ඔවුන් විසින් කිසිදු නීතියක් හෝ සදාචාරයක් නොමැතිව ලාංකිකයන්ට පීඩා කරනු ලැබීය(මහාවංසො, 2005 : 1/55 - 56). මෙලෙස ධර්ම පරාක්‍රමබාහු රජු මෙරට පෘතුගීසි විෂබීජය රෝපණය කර මරණයට පත් වූ අතර පෘතුගීසීහු මුස්ලිම් වෙළඳුන්ට පීඩා කොට ඔවුන් මර්ධනය කරමින් ලාංකික ජනයා සතු ධනය පැහැර ගනිමින්, ස්ත්‍රී දූෂණයන්හි නිරත වෙමින් කල්ගත කළහ. මේ තත්ත්වය මත ධර්ම පරාක්‍රමබාහුගෙන් පසු රජ වූ 7 වන විජයබාහු (ක්‍රි.ව. 1513 - 1521) විසින් 20,000(මහාවංසො, 2005 : 1/66) කට අධික හමුදා සේනාංකයක් සමඟ කොළඹ කොටුව වටලමින් පෘතුගීසීන්ට දරුණු ප්‍රහාරයක් එල්ල කළහ(මහාවංසො, 2005 : 1/66-67). පෘතුගීසීහු මේ ප්‍රහාර නිසා මාස 6 ක් පමණ කාලයක් යම් දුෂ්කරතාවකට පත් වුව ද ඔවුන් විසින් ප්‍රතිප්‍රහාර දී ලාංකික හමුදාවන් මැඩ පැවැත්විය. මෙකල රෝමානු නගරයෙන් පැමිණි පෘතුගීසි පූජකයෝ රෝමානු ලබ්දිය මෙරටට ගෙන එන ලද අතර ශ්‍රී ලංකා ඉතිහාසයේ පළමු වරට (රෝමානු) කතෝලික සභාව(මහාවංසො, 2005 : 1/71) මෙරට ආරම්භ කරනු ලැබීය. විජයබාහු හා සිය සහෝදර ශ්‍රී රාජසිංහ එකගෙයි කෑමේ ප්‍රතිඵලයක් ලෙස ජාතක වූ පරරාජසිංහ, භුවනෛකබාහු, රයිගම්බණ්ඩාර හා මායාදුන්නේ යනුවෙන් පුතුන් සිවු දෙනෙක් සිටි(මහාවංසො, 2005 : 1/73-74 : රාජාවලිය, 1917 : 224) අතර මොවුන්ගෙන් පරාරාජසිංහ නම් වැඩිමහල් කුමරු කුඩා අවධියේ දී ම මිය ගියේය. විජයබාහු රජුගේ පළමු බිසව මිය යාමෙන් පසු රජු විසින් සරණ පාවාගත් දෙවන බිසවගේ උපක්‍රමය වූයේ සෙසු කුමාරවරුන් මරා තම පුතුට රජකම ලබා දීම ය. රජු විසින් කඳුරේ බණ්ඩාර හා ඒකනායක මුදලි සමඟ කතිකා කොට තම දෙවන බිසවගේ පුතු රජකමට පත් කිරීමට අදාළ යෝජනාව කුමාරවරුන් වෙත ගෙනාව ද ඊට අකැමති භුවනෛකබාහු, රයිගම්බණ්ඩාර හා මායාදුන්නේ ප්‍රතිචාරය (රාජාවලිය, 1997 : 225) වූ විජයබා කොල්ලය හේතුකොටගෙන විජයබාහු රජු මරණයට පත් වූ අතර ලාංකික රජ පරපුරේ ගොඩනැගෙමින් පැවති මෙම වියවුල්කාරී දේශපාලන වාතාවරණය පෘතුගීසීන්ට තම බලය ව්‍යාප්ත කිරීමට අවස්ථාවක් ලබාදුන් අතර එකී තත්ත්වය ම ලාංකිකයන් සංග්‍රාමීය මානසිකත්වය තුළ ඇද බැඳ තැබීමට හේතු විය. පසුව ඇමතිවරුන් එකතුව නිත්‍යානුකූල රජු භුවනෛකබාහු ලෙස පත් කරන ලද අතර මොහු 7 වන බුවනෛකබාහු

(ක්‍රි.ව.1521- 1551) නමින් ප්‍රසිද්ධියට පත් විය. මෙකල විජයබාහු රජුගේ ඇවැස්ස බෑණා වූ වීරසූර්ය(පිළැස්සේ වීදියේ බණ්ඩාර) හා මනම්පේරි අස්වල ආරච්චි(රාජාවලිය, 1997 : 226-227) විසින් සාපිටිගම් කෝරළේ 'අඹන පොහොන්නරුව' නම් ගමේ ඇති කරන ලද පෙරළියට විරුද්ධව සේනාව සමඟ ගොස් යුධ කර ඔවුන් දෙදෙනා ම ඝාතනය කොට සාපිටිගම් කෝරළේ ප්‍රධානියාගේ ගම් කිහිපයක් තෑණ කපන පන්ඩයින්ට රජු විසින් ලබා දුන්නේය. පස්දුන් රටේ හා රයිගම පාලනය රයිගම් බණ්ඩාර කුමරුට පවරන ලද අතර සීතාවක අධිපතියා වූයේ මායාදුන්නේ ය. කෙටි කලකින් රයිගම් බණ්ඩාර මිය ගිය පසු එම ප්‍රදේශයේ බලය ද ලබා ගත් මායාදුන්නේ සීතාවක බල ප්‍රදේශය ව්‍යාප්ත කර ගත්තේය.

පෘතුගීසීන් විසින් ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර දේශපාලන, ආර්ථික, සාමාජික ක්‍රියාකාරකම්වලට කරන ලද අනවශ්‍ය අත පෙවීම හමුවේ ඊට විරුද්ධව පළමු විරුද්ධවාදී අදහස් ආරම්භ වන්නේ මෙම සීතාවක පාලකයන්ගෙනි. මායාදුන්නේ විසින් බුවනෙකබාහු රජකමෙන් පහකර කෝට්ටේ බලය ද ලබා ගැනීමට ප්‍රයත්න දැරුව ද එය ව්‍යර්ථ විය(මහාවංසො, 2005 : 2/6 - 7). භුවනෙකබාහුගේ දියණිය වූ සමුද්‍රාදේවිය වීදිය බණ්ඩාරයන්ට සරණ පාවා දෙන ලද අතර ධර්මපාල හා විජයපාල නමින් මොවුන්ට පුතුන් දෙදෙනෙක් වූහ(මහාවංසො, 2005 : 2/12- 13 : රාජාවලිය, 1917 : 229-230). භුවනෙකබාහු රජුගේ කැමැත්ත අනුව ධර්මපාල කුමරුට රජකම භාරදීම සඳහා ඔහුගේ පිළිරුවක් හා ඔටුන්න රත්තරනින් නිමවා පෘතුගාලයේ ලිස්බන් නුවරට යවා එරට රජු අතින් එම පිළිරුවට රන් ඔටුන්න පළඳවමින් ධර්මපාල දොන් ජුවන් (ධර්මපාල) බවට පත් කරන ලදී(මහාවංසො, 2005 : 2/16- 21). මායාදුන්නේ රයිගම් බණ්ඩාර හා එක් වෙමින් කෝට්ටේ මෙම ක්‍රියාපටිපාටියට විරුද්ධ ක්‍රියා කිරීම මත භුවනෙකබාහු විසින් බේරීමේ උපායක් ලෙස පෘතුගීසි රජුට විශාල පඬුරු ප්‍රමාණයක් සහිතව හසුන් ලියා සලප්පු ආරච්චි(රාජාවලිය, 1997 : 227) සමඟින් ධර්මපාල කුමරුන් පෘතුගාලයට යවන අතර ඒ අනුව පෘතුගීසි ආධාර ද ලබා ගැනීමට සමත් විය. ලාංකිකයන් පරාධීනත්වයට පත් කිරීමේ මෙම සිදුවීම දෙදහස් අසූපස්වන බුද්ධ වර්ෂයේදී සිදු විය(මහාවංසො, 2005 : 2/20). ධර්ම පරාක්‍රමබාහුගේ විසි වසරක රාජ්‍ය කාලයේත්, විජයබාහුගේ පහළොස් වසරක රාජ්‍ය කාලයේත්, පෘතුගීසීන් කොළොම්තොට වෙළඳාමේ නිරත විය. පෘතුගීසීන්ට වෙළඳ භාණ්ඩ ලබා ගත යුතු වූයේ රජු ඇතුළු මෙරට ප්‍රභූ පන්තියෙන් හෝ මුස්ලිම් වෙළඳුන් මාර්ගයෙනි. සිංහලයන්ගේ අකමැත්ත හා මුස්ලිම්වරුන්ගේ හිරිහැර නිසා කොළඹ මැද ඉදි කොට තිබූ බලකොටුවක් ක්‍රි.ව. 1524 දී පෘතුගීසි විසින් රජුගේ අණ පරිදි ඉවත් කෙරිණි. මේ කොටුව ඉවත් කිරීමට බුවෙනකබාහු රජු කැමැත්තක් නොදැක්වීය. ඒ නිසා තම සහෝදරයන් වූ රයිගම බණ්ඩාර හා මායාදුන්නේගෙන් සිදුවිය හැකි තර්ජන නිසා පෘතුගීසි හමුදා භටයන් 20

දෙනෙක් තම ආරක්ෂාව සඳහා යොදවා ගත්තේය. බුවනෙකබාහු රජු ද පෘතුගීසි හමුදාවට පඩි නඩි ගෙවීමට භාණ්ඩ සැපයීමටත් කැමැත්ත දැක්වීය. විදේශිකයන් කෙරෙහි ගැති මානසිකත්වයෙන් සිටි බුවනෙකබාහුගේ ක්‍රියාකලාපය පෘතුගීසීන්ගේ යුධ බලය කෝට්ටේ රාජ්‍යයේ ස්ථාවර වීමට බලපෑ සාධකයක් විය. බුවනෙකබාහුගේ දේශපාලන හා පරිපාලනය අදහස් උදහස් මත පෘතුගීසීහු තම වපසරිය වර්ධනය කරගනිමින් මෙරට නීත්‍යානුකූල රාජ්‍ය භාරකාරිත්වය හා ආගමික සංස්කෘතික අංශය කෙරෙහි අති ප්‍රබල බලපෑමක් එල්ල කළහ.

පෘතුගාල රජු, ධර්මපාලගේ පිළිරුව පෘතුගාලයේ සිට මෙරටට එවූ අතර කතෝලික ධර්මයේ හික්මවීම සඳහා රෝමානු පාදිලිවරු ද මෙරටට එවූහ. මොවුන් අතරින් අයෙක් ධර්මපාලගේ ගුරුවරයා(මහාවංසො, 2005 : 2/23) බවට පත් විය. මේ අනුව මෙතෙක් කලක් රජ කුමරෙකු මෙන් ම රජුගේ ද අනුශාසකයා බවට පත් වූ බෞද්ධ භික්ෂුවට එම තත්ත්වය අහිමි වී කතෝලික පූජකයකුට ඒ තත්ත්වය හිමි විය. මේ අනුව ක්‍රි.ව.1551 න් පසු බුදුදහමේ දසරාජ ධර්මය මුල්කරගත් රාජ්‍ය පාලන අනුශාසනාව කතෝලික දේව ධර්මයේ පූජක අනුශාසනය බවට පත් වේ. මෙලෙස පැමිණි පූජකයෝ ලක්දිව කතෝලික ආගම ව්‍යාප්තිය සඳහා කටයුතු කළහ. භුවනෙකබාහුගේ උපකාරය මත බෞද්ධයන්ගේ අකමැත්ත නොතකමින් රටවැසියන් රවටමින් පාදිලිවරු ලාංකිකයන් කතෝලික ආගමට හරවා ගත් අතර මුහුදුබඩ පළාත්වල පල්ලි සෑදීමට ක්‍රියා කළහ(මහාවංසො, 2005 : 2/25-26). ධර්මපාල රජුගේ ක්‍රියා කලාපය ගැන කලකිරී කුපිත වූ සිංහලයෝ මෙකල කෝළාහල කළ අතර ධර්මපාල රජු දළදාව රැක්ම කෙරෙහි දැක්වූ ආනාදරයත් මායාදුන්න රජු ඒ සඳහා දැක්වූ අනුග්‍රහයත් සිංහල බෞද්ධයන් කුළුගන්වන කරුණක් වූ බැවින් මායාදුන්නේට පක්ෂව රාජසිංහ කුමාරයාගේ සේනාවට සීඝ්‍ර ලෙස වැඩි දියුණු වීමට එය ප්‍රබල සාධකයක් විය. දේශපාලනික ක්‍රියාකාරකම් හැරෙන්නට ලාංකිකයන්ගේ සංග්‍රාමෝපක්‍රමවල නව ප්‍රවණතා සඳහා රදළ නායකයන්ගේ ක්‍රියා කලාපය, භික්ෂූන්ගේ ක්‍රියා කලාපය, පොදු ජනතාව තුළ විදේශිකයන් සම්බන්ධයෙන් ගොඩනැගෙන අප්‍රසාදය (පොදු ජනයාගේ ක්‍රියා කලාපය), යුරෝපීයයන් සතු නව යුධෝපකරණ සහ ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමට ලාංකිකයන් උනන්දු වීම යන කරුණු හේතු විය.

ශ්‍රී ලංකාවේ අගනගරය වූ කෝට්ටේ රාජ්‍ය කොටස් 3 කට බෙදුන ද විදෙස් ජාතිකයන්ට විරුද්ධව ගෙන ගිය අරගලයේ මූලිකත්වය ගැනීමට සීතාවක රජවරු සමත් වූහ. රාජ උරුමක්කරුවන් අතර තිබූ පරස්පර විරෝධී අදහස් 15 වන සියවසේ ශ්‍රී ලංකාවේ ඒකීය රාජ්‍යයේ විභේදනයට හේතු විය. ශ්‍රී ලංකා රාජ්‍ය කොටස්වලට බෙදුන ද එය මෙරට දේශපාලන ප්‍රවාහය තුළ වෙනස් ආරක පියවරක් අරඹමින් සංග්‍රාමීය මානසිකත්වය සහිත

බෙදුණු රාජ්‍යයක්, ජනතාවක් සහ රජවරු නිර්මාණය කරලීමට ඉවහල් වූ කරුණක් විය. එලෙස බිහිවූ සීතාවක රාජ්‍යය සංග්‍රාමීය රාජ්‍යයක් ලෙස ම වර්ධනය වීමට එම රාජ්‍ය සතු වූ භූගෝලීය පිහිටීම, බෞද්ධ භික්ෂූන්ගේ බලය හා ජන සනත්වය ද ප්‍රබල සාධකයන් විය(අමරසිංහ, 1998 : 226-228). සීතාවක රාජ්‍යය සතු ප්‍රදේශ වන්නේ සතර කෝරළය, දෙනවක, බුලත් ගම, හේවාගම් කෝරළයේ අඩක්, කුරුවිට, අටලුගම්, පනාමල්, හදපන් දූනු, බෙලිගල් සහ දෙහිගම්පොල යන සය කෝරලය ය. වන දූර්ග, ගිරි දූර්ග, පංක දූර්ග පිහිටු වීම පැරණි රාජධානිවල දක්නට වූ ක්‍රමවේදයක් වන අතර සීතාවක ද පිහිටා ඇත්තේ පංක දූර්ගයක ය. මේ රාජධානියේ 3/5 කම ජලය රැඳී තිබූ නිසා මෙම භූමිය පංක දූර්ගයක පැවති බව පැහැදිලි ය(Fernwndo, 1973 : 15). මෙම භූගෝලීය පිහිටීම සීතාවක වර්ධනය කෙරෙහි බලපෑ අතර සීතාවක භික්ෂුගේ ක්‍රියාකාරිත්වය ද මෙම යුධ බලය ශක්තිමත් කිරීමට හේතු වී තිබේ. කෝට්ටේ රාජ්‍ය කොටස් තුනකට වෙන් වීමෙන් පසු ආගම හා රාජ්‍ය අතර සම්බන්ධය යන කරුණ සම්බන්ධයෙන් සීතාවක රාජ්‍යය ඉදිරියට පැමිණීමට මෙම සංඝ බලය ප්‍රබල හේතුවක් විය. පෘතුගිසි ලක්දිවට පැමිණි මුල් සමයේ ඔවුන්ට සාපේක්ෂව ලාංකිකයෝ දියුණු කර ගත් අවි ආයුධ අතර වෙඩි අයුධ විරල වුව ද පිරිස් බලය අතින් අධිකතර වීම මෙකල සටන් ජයග්‍රහණය පිණිස ප්‍රබල හේතුවක් විය. රාජසිංහ විසින් මුල්ලේරියා වෙලේ පෘතුගීසීන් සමඟ වූ සටන ජයග්‍රහණයට අන් සියලු රාජ්‍ය පරාජය කළ සීතාවක ජනසනත්වය හේතු විය. මෙම කරුණු පදනම් කරගෙන සීතාවක රාජ්‍යයේ රජවරු කැපී පෙනෙන සංග්‍රාම වීරත්වයකට හිමිකම් කියූහ.

මායාදුන්නේගෙන් පසු රජ වූ රාජසිංහ රජුගේ ප්‍රධාන අරමුණ වූයේ පියා විසින් ඇති කළ යුධ ප්‍රයානය ඉදිරියට ගෙන යාමයි. සතුරු සේනා මැඩලීම පිණිස මායාදුන්නේ විසින් රාජසිංහට පැවරීම නිසා ප්‍රබල හමුදා(රාජාවලිය, 1997 : 237) සේනාවකින් සන්නද්ධ වූ රාජසිංහ රජු බුද්ධ වර්ෂ 2102(මහාවංසො, 2005 : 03/05) දී මුල්ලේරියාවේ කඳවුරු බැඳ(මහාවංසො, 2005 : 03/06) පෘතුගීසීන් හා යුධ කොට ධර්මපාලගේ පක්ෂය ගත් පෘතුගීසීන්ට දැඩි විනාශයක් සිදුකොට පෘතුගීසීන් 1600 ක් ඝාතනය කළේය. මුල්ලේරියාවෙන් පැරදුනු පෘතුගීසීන් කොළඹ කොටුවට පැමිණිය ද කොටුව වටලා පෘතුගීසීන්ගේ බාහිර ලෝකය සමඟ සම්බන්ධකම් පැවැත්වීම මඟ අහුරා ලීමට රාජසිංහ ක්‍රියා කළේය. සටනින් පසු සීතාවක රාජ්‍යයේ මායිම කඩුදෙවොල රග්ගහවත්ත තෙක් විශාල කළේය(රාජාවලිය, 1997 : 237). පරංගි යුද්ධ සඳහා පැමිණි ජුවන් කොරයා ද බ්‍රිතෝ ශ්‍රී ලංකාවේ ප්‍රධාන කපිතාන් ධූරය දැරූ (ක්‍රි.ව. 1583-1590) කාලය මුල් කරගනිමින් මේ සටන ක්‍රි.ව. 1583 ඔක්තෝබර් මස සිදු විය(අමරසිංහ. 1998 : 128-129). කොටුව තුළ සිර වූ පෘතුගීසීන්ට ආහාර පාන පවා සපයාගත නොහැකි වීමෙන් ඔවුහු

අශ්ව මස් සහ මිනිස් මස් අනුභව කළහ(මහාවංසො, 2005 : 3/10). කලක් ගතවීමෙන් පසු පෘතුගීසි සේනාව නැව්වලින් පැමිණි ආධාර ලබා දුන් අතර ඒ අනුව මේ වන විට දුර්වල තත්ත්වයක සිටි ලාංකික හටයෝ එළවා දැමීමට පෘතුගීසිහු සමත් වූහ. ඉන් පසුවත් රාජසිංහ විසින් පෘතුගීසීන් පරාජය කිරීමට උත්සාහ කළ ද ඒ උත්සාහයන් ජයග්‍රහණය කරවීමට ඔහු අසමත් විය. රාජසිංහ යනු යුධ ශිල්පය පිළිබඳ කෘතහස්ත දැනුමක් හා පුරුද්දක් පැවතියෙකි(මහාවංසො, 2005 : 3/14). මහාවංස විස්තරයට අනුව මොහු පියා පාලනය කළ රාජ්‍යයෙහි රජු බවට පැමිණි බව දැක්වුව ද ඔහු පීතෘ ඝාතනය කළ බවක් සඳහන් නොකරයි(මහාවංසො, 2005 : 3/15). රාජසිංහ යනු භයානක සිත් කළු වූ දක්ෂ උදාර අදහස් ඇත්තාවූ සිංහයකු බඳු වුවකු බවට මහාවංසය වර්ණාත්මක(මහාවංසො, 2005 : 3/16) දැක්වීමෙන් පැහැදිලි වන්නේ මෙකල ලාංකිකයන්ගේ සංග්‍රාම ශූරත්වය පිළිබිඹු කරන ප්‍රබල ම කැඩපත බවට රාජසිංහ චරිතය පත් වූ බවයි. රාජසිංහ යුගයේ පෘතුගීසීන් සමඟ වූ යුධ පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් කිරීම තුළින් නව විදේශීය ජාතියක් හමුවේ ලාංකිකයන්ගේ සංග්‍රාමෝපක්‍රම හා සංවිධානයේ නව ප්‍රවනතා පිළිබඳ යම් පිවිසුමක් ලබා ගත හැකි ය.

ක්‍රි.ව. 1579 අප්‍රේල් 27 දා පෘතුගීසීන්ට විරුද්ධව කොළඹ කොටුව වැටලීමේ සටන(Queyros, 1930 : 431) ඉතා විශාල හමුදාවක් සහිතව (Queyros, 1930 : 431 ) රාජසිංහගේ නායකත්වයෙන් ආරම්භ විය(Queyros, 1930 : 43-437, 439-442, 454). මෙම හමුදාව කැලණි ගං ඉවුරේ ලැගුම් ගත් අතර එදින ම මනුවෙල් ද සූසා(ක්‍රි.ව.1558-1591) කපිතාන්වරයෙකු වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණියේ ය. රාජසිංහගේ ප්‍රහාරවලට බියෙන් මහලු රෝගී පෘතුගීසීන් 300 ක් පමණ ද ලස්කිරිඤ්ඤ හටයන් 500 ක් පමණ ද කොළඹ කොටුව තුළ දී සූසා දුටු බව ක්වෙරෝස් වාර්තා කරයි(Queyros, 1930 : 431). මෙකල කොළඹ කොටුවේ තාප්පය ජරාජීර්ණ වී ඉතා දුර්වල තත්ත්වයේ පැවති අතර ආරක්ෂා සහිත ගේට්ටුවක් නොවීය. කොටුවට ආහාර සැපයීම ද අඩු වී තිබිණි. මේ වන විට ශාන්ත තොමේ නම් මුර කුලුන අසළ පෘතුගීසි කඳවුරක් පැවතිණි. මෙයට සිංහල හමුදාව ළගාවත්ම පෘතුගීසිහු කාලතුවක්කු ප්‍රහාර එල්ලකර ඔවුන් පසු බැස්සවූහ. කොළඹ කොටුව වැටලීම පිළිබඳව ඇසූ දොන් ෂොර්ගේ ද මෙනෙසෙෂ් විසින් කොචිං(දේශයේ) සිට මිගෙල් කුතින්ඤෝ පෙරෙයිරාගේ නායකත්වයෙන් නැව් 3 ක් ඒවීය(Queyros, 1930 : 432). එමෙන්ම නාග පට්ටමෙන් ආර්තු ද කස්තේල් බ්‍රොන්කෝ යටතේ ෆිස්ටාවක් (නමින් හඳුන්වන ටොන් 1000 ක පමණ ධාරිතාවයෙන් යුතු මුහුදු නැවක්) ද බෙල්ෂියෝර් රොඩ්රිගේෂ් කල්දෙයිරා විසින් සෙබළුන් හා යුධෝපකරණ සහිත තවත් එවැනි ම ෆිස්ටාවක් මන්නාරමෙන් ද එවූ අතර ගෝවේ විසුරේ විසින් තෝමේ ද සූසා

කුතින්ඤෝ යටතේ කරවෙල්ලාවක්(ටොන් 2000 ට අඩු බරක් ඇති නැවක් Pieris & fitzler., 1927 : 353-355) සහ ටොන් 1000 ක පමණ ධාරිතාවක් දැරිය හැකි සාමාන්‍යයෙන් ටොන් 500 ක් පමණ බර මුහුදු යාත්‍රාවක් වන ගැලීආම් (Pieris & fitzler., 1927 : 343-344) 3 ක් ද මෙහි එවා තිබේ. මේ අතර රාජසිංහ රජුට උදවු වීම සඳහා යුධ උපකරණ සහිතව මලබාර් නැව් සමූහයක් හලාවතට පැමිණියේය. එහෙත් එමඟින් සැලකිය යුතු සේවයක් සැපයුණේ යැයි සැලකිය නොහැක.

ක්‍රි.ව. 1580 මාර්තු 6 දින රාජසිංහ හමුදාව කොටුවට දරුණු පහරක් එල්ල කළේය. මේ සඳහා අතපත්තු හමුදාව හා ඇතුන් තුන් දෙනෙකු යෙදවූහ. "අතපත්තු" යනු රාජකීය ආරක්‍ෂක හමුදාවයි(විමලකීර්ති, බු.ව.2499 : 161). මහවාසල හා එහි අංගෝපාංගයන් ආරක්ෂා කළ හෙයින් ද සංඛ්‍යාව අතින් අනෙක් අතපත්තු ඉක්මවා සිටි හෙයින් ද "මහ අතපත්තුව" එනමින් හඳුන්වා තිබෙන අතර කුඩා කොඩි, මුර ආයුධ, ලේකම් මිටි, කොඩිතුවක්කු ආදිය තැන්පත් කළ ගබඩාවනුත් ආරක්‍ෂා කිරීම "දිසාවේ අතපත්තුව" විසින් සිදු කළේය(විමලකීර්ති, බු.ව.2499 : 161; රාජාවලිය. 1997 : 234; De Queyros.1930 : 419;439). මෙම ප්‍රහාරයේදී සුසාගේ පහරදීම් හමුවේ ලාංකික හමුදාව පසු බැසි අතර රජුගේ ඇතෙකු මරණයට පත් විය. ඇත් හමුදාව සටන් විජයග්‍රහණය උදෙසා යොදා ගැනීම අතීතයේ සිට ලක්දිව පැවති සටන් උපක්‍රමයකි. රාජසිංහ මේ අතර බේරේ වැව හිස් කරනු සඳහා ඇළක් කැපූ අතර ඒ හේතු කොටගෙන ජලමට්ටම පහත බැසීම නිසා පෘතුගීසි යාත්‍රාවලට ගමන් කිරීම අපහසු විය. දෙවනිවර රාජසිංහ කොළඹ කොටුව වැටලීමේ දී ද මේ ක්‍රමය අනුගමනය කළේය(Barros and Diogo do Couto, 1993 : 133). පවතින පරිසරය හා සතුරා අනුගමනය කරන උපාය මාර්ග අනුව ලාංකිකයන් ද නව සටන් උපක්‍රම අත්හදා බැලූ බව රාජසිංහගේ මෙම ක්‍රියාවෙන් පැහැදිලි වේ. ලාංකික හමුදාවක් විසින් 1580 මාර්තු මස 13 දින ප්‍රැන්සිස්කු දූපතට හා කොටුවට පහර එල්ල කළ අතර මේ වන විට බේරේ වැව සිඳී ගොස් තිබූ බැවින් පෘතුගීසි යාත්‍රා පැදවීම ඇන හිට තිබුණි. ජීවිත ආසාවකින් තොරව රාජසිංහ රජුගේ ලාංකික හමුදා භටයන් කොටුව තුළට පිවිසි අතර එහිදී තිදෙනෙකු මරුමුවට පත් විය. කොළඹ නගරයේ දුර්භික්ෂයක් ඇතිවීමෙන් ජනතාව 30,000 ක් පමණ ප්‍රමාණයක් කුසගින්නේ පෙළෙන්නට වීම නිසා ක්‍රි.ව. 1580 මාර්තු අප්‍රේල් කාලයේදී අන්තෝනියෝ ද ලීමා සහ අන්තෝනියෝ කොරයා ද සිල්වා විසින් ආහාර හා වෙනත් අවශ්‍ය දෑ සහිතව නැව් 2 ක් රැගෙන පැමිණීම නිසා ඒ වන විට ඇතිව පැවති දූර්භික්ෂ තත්ත්වය මදක් තුනී කරගැනීමට පෘතුගීසීහු සමත් වූහ. මේ අතර වික්‍රමසිංහ, නවරත්න සහ විජේකෝන් නමින් හැඳින් වූ රාජසිංහ රජුගේ මුදලිවරු තිදෙනෙක් විසින් එල්ල කළ ඉතා දරුණු ක්ෂණික ප්‍රහාර නිසා පෘතුගීසින්ට

දැඩි විනාශයක් සිදු විය. එම නිසා වහා ම සයිමන් ද සිල්මෙයිරා යටතේ ගෝවේ සිට සෙබළුන් 80 ක් සහ මුදල් හා ආහාර ද එවනු ලැබිය(Queyros, 1930 : 435). ක්‍රි.ව. 1580 අගෝස්තු මස අගදී ආහාර පාන හා යුධෝපකරණ සහ සෙබළු 80 ක් සහිත නැවක් කොචිංහි සිට පැමිණියහ. දොන් ප්‍රන්සිස්කු දූපතට ක්‍රි.ව. 1581 ජනවාරි 20 දින ලාංකික හමුදාව ප්‍රහාර එල්ල කළ අතර එයින් එල්ල වූ ප්‍රතිප්‍රහාරවලින් ලාංකික හමුදා භටයන් කිහිප දෙනෙක් මිය ගිය බැවින් ලාංකික සේනා පසු බැස්සේ ය. ක්‍රි.ව. 1518 ජනවාරි 18 දින තෙක් මාස 22 ක් පුරා ලාංකික සේනා වරින් වර කොටුවට ප්‍රහාර එල්ල කළේය. එහෙත් මතියාස් ද අල්බු කැර්ක ලස්කිරිඤ්ඤ භටයන් 300 ක සේනාවක් සමඟ කොළඹට පැමිණීම නිසා රාජසිංහ රජුගේ ක්‍රියාකලාපය තරමක් මන්දගාමී විය. අල්බු කැර් විසින් රාජසිංහ හමුදාවට පහර දෙන ලෙස පෘතුගීසි හමුදාව වෙත බලකර සිටිය ද ලාංකිකයන්ගේ ප්‍රහාරවලින් දැඩි පීඩාවට පත් වීම නිසා ඔවුහු ඊට අකැමති වූහ. මෙම සටනේදී ලාංකික හමුදාවේ සෙනරත් මුදලි සමග සිටි සෙබළු 19 ක්, අමතර සෙබළු 1000 ක් හා තවත් විශාල පිරිසක් මරණයට පත් වීම නිසා රජු සේනාවන් සමඟ කැලණියට පසු බැස්සේ ය(Queyros, 1930 : 437-438). කොටුව අල්ලා ගැනීමට ආරම්භ කළ අවස්ථාවේ සිට මේ කාලය දක්වා ලාංකික සෙබළුන් 9000 ක් පමණ පෘතුගීසින් අතින් මැරුම් කෑ අතර පේරු ගොන්සාල්වේෂ්, සෙබස්තියම් ලුයිෂ්, ගිල් ද ගෝයිෂ්, රොද්‍රිගෝ අල්වාරේෂ්, පේරු ෆර්නැන්දෙෂ්, ගස්පාර් ජෝර්ගේ, ජො ආඕ ද සා, ලුයිස් ජුෂ්ර්වේ, ජෙ ආම් වෙල් ඕ, සෙබස්තියඕ රොඩ්රිගුයෙස්, දොමින්ගොෂ් මෝස් කෝසු, කුස්මේ ෆර්නැන්දෙෂ්, සිමොඕ ද මාතුෂ්, සිමොඕ සොද්රේ, මනුවෙල් ද පීනා, සෙබස්තියම් නුගේරා, මිගෙල් රොද්‍රිගේෂ්, ගස්පර් ගොමෙෂ්, ගොන්සාලු වියෙයිරා, ක්‍රිස්තොවාඕ ගොන්සාල්වෙෂ් යන දක්ෂ පෘතුගීසි යුධ නිලධාරින් ඇතුළු 87 දෙනෙක් ලංකික හමුදා අතින් මරණයට පත් වූහ(Queyros, 1930 : 438). මේ වැටලීම පිළිබඳව සටහන් කරමින් රාජාවලියේ කතුවරයා පවසන කෙටි විස්තරය තුළින් පැහැදිලි වන්නේ මෙය සංවිධානාත්මක හා සැලසුම් සහගත ලෙස සිදු කර ඇති බවයි(රාජාවලිය, 1917 : 239-240). කොටුව වැටලීම සඳහා රාජසිංහ රජු උඩරටින් උමං කැනවුම්කරුවන් ගෙන්වා උමං කැණ වූ බව එහි සඳහන් වේ(රාජාවලිය, 1917 : 240). මේ වැටලීමෙන් පෘතුගීසින්ට බරපතල හානි සිදු විය. මේ හේතු කොටගෙන ක්‍රි.ව. 1581-82 කාලයේ ගෝවට කුරුඳු යැවීමට පවා නොහැකි විය(ඡසැරසිල 1983 එ 524). ක්‍රි.ව.1580 වන විට පෘතුගීසින්ට කොළඹ හැර ශ්‍රී ලංකාවේ කිසිදු බිම් අගලක් හිමි නොවුනි. රාජසිංහ විසින් කොළඹ කොටුවට පහර දීම අසාර්ථක වීමට ප්‍රබල හේතු වූයේ යුධෝපකරණ අංශයෙන් දියුණුව සිටි පෘතුගීසි හමුදාවලට ක්‍රමානුකූලව මුහුණ දීමට තරම් ලාංකික හමුදා යුද්ධ තාක්ෂණය අංශයෙන් දියුණු නොවීම බවට මතයක් වේ(අමරසිංහ, 1998 : 122).

ක්‍රි.ව. 1582 දී පෘතුගීසීන් විසින් තව වැටලීමක් අපේක්ෂාවෙන් කොළඹ කොටුව ප්‍රතිසංස්කරණය කළේය(Couto, 1993 : 228-387). පළමු සටනේ පරාජයෙන් ලද අත්දැකීම් අනුව රාජසිංහ විසින් මේ අවස්ථාවේ කුත්ජි අලී යන නාවික හමුදාපතිගේ ආධාර සහ යාන්ත්‍රික උදව් ලබා ගත්තේය. වෙඩික්කරුවන්, වෙඩි බෙහෙත් හා කාර්මිකයින් විදේශයෙන් ගෙන්වා ගැනීමට කටයුතු කළේය. ක්‍රි.ව. 1587 වන විට රාජසිංහගේ නාවික බලඇණිය නැව් 22 හා විශාල කුඹ ගසක් සහිත යාත්‍රාවක් සහිතව යුධ ශක්තිය වර්ධනය විය. මේ සීතාවක බලඇණිය සමඟ සටන් කරනු පිණිස ක්‍රි.ව. 1586 දී තෝමේද සූසා ආරොන්වෙස් කපිතාන්වරයා ලෙස ශ්‍රී ලංකාවට පැමිණියේ ය. මෙකල ලාංකික හමුදාවේ සටන් උපක්‍රමයක් ලෙස කපිතාන්වරු කිහිප දෙනෙක් පෘතුගීසි හමුදාවට එක් වූහ. කොළඹ කොටුව වැටලීම සඳහා රාජසිංහ සංවිධානාත්මක සටනක් දියත් කළේය. ඒ අනුව විජේකොන් මුදලි හා ගජනායක ආරච්චි ඇතුළු පිරිස ක්‍රි.ව. 1587 ජුලි 4 දින කොළඹ කොටුවට පැමිණි දෙවනි වරට කොළඹ කොටුව වැටලීමේ ක්‍රියාවලිය ඇරඹීය(Couto, 1993 : 229). කූතෝගේ විස්තරයට අනුව රාජසිංහගේ බලඇණියේ භේවායන් 50,000 අවශේෂ, කුළීකරුවන් 60,000, සටන් සඳහා හා සේවාවන් සඳහා වන ඇතුන් 2200 ක්, විශාල හා කුඩා ලෝකඩ කාලතුවක්කු 150, ගැල් ගොන් 40,000, පොරෝ 10,000, නාරස්සන 3000, කැති 20,000, කුන්තව් 2000, උදලු 6000, දුනු හිස නිර්මාණය කිරීම සඳහා හා අනෙකුත් ලෝහ වැඩ සඳහා ලෝකුරුවෝ 400ක්, බෝට්ටු 400 ක් පමණ ද “ෆුස්ටාන්” සහ “ක්‍රැටූර්” නම් යාත්‍රා 65 ක් සහ වෙනත් විශාල යුද්ධායුධ තොගයකින් ද පොහොසත්ව සටන් වැදුණු බව සඳහන් කරයි (Couto, 1993 : 289-290). කොළඹ කොටුව වැටලීමෙන් පසු රාජසිංහ යාපනය හැර මුලු ශ්‍රී ලංකාව ම තමන්ට නතු කර ගැනීමට සමත් විය. කොළඹ කොටුවට පහර දීම පිණිස රාජසිංහ රජු අනුගමනය කළ ක්‍රියාමර්ග මෙහිදී සැලකිල්ලට බඳුන් කළ යුතුය. මෙවෙලේ බේරේ වැවේ බැම්ම දූර්වල වූයෙන් ඉන් කොටුවට පිවිසීමට පහසු බව තීරණය කොට වැවේ ජලය හිස් කළේය (Couto, 1993 : 293). මේ සඳහා වර්තමානයේ සාන්ත බස්තියම් කන්ද හරහා කපන ලද ඇළ මඟින් මාලිගාවත්තේ වගුරු බිම් දෙසට තවත් ඇළක් මඟින් ද ජලය ඉවත් කළ ද වැව හිස් කිරීමේ උත්සාහය ව්‍යර්ථ විය. ඉන් පසු ඇතුන් ලවා පවුර බිඳලීමට තැත් කළ ද පෘතුගීසීන් එය මනාව අරක්ෂා කළ හෙයින් එය ද ආසර්ථක විය. කොළඹ කොටුව අරක්ෂා කිරීම සඳහා පෘතුගීසීන් ඉටු කළ සංවිධානාත්මක වැඩ පිළිවෙළ පිළිබඳ කූතෝ ඉතා දීර්ඝ විස්තරයක් කරයි (Couto, 1993 : 293-297). සාන්ත ජො ආම්, සාන්ත ස්තෙපන්, සාන්ත අනා, යන සාන්ත සෙබස්තියම් මුර කුළුනේ සිට සාන්ත ආනා මුරකුළුන තෙක් අවුස්ත්‍රියාවේ දොන් ජොන් අම් හෙවත් උඩරට මුදලි නැතහොත් කොනප්පු බණ්ඩාර විසින් ආරක්ෂා කෙරිනි. සාන්ත ගොන්සාලේ

තෙක් දිවෙන ආරක්ෂක බලකොටු තාප්පය ආරච්චි(තනවීර) හා ලස්කිරඤ්ඤ හමුදාව විසින් ද සාන්ත ගොන්පාලේ සිට සාන්ත මිගෙල් මුර කුලුණු තෙක් සිංගප්පුලි (Chinapuli) සාන්ත පවුලේ සිට කුරුප්පු ආරච්චි හා තෝමස් පිරිස් විසින් ද ආරක්ෂා කළ අතර සිනියා ආරච්චි, ජෙරියා ආරච්චි, සාන්ත කතිරිනා ආදී සිංහලයින් විසින් මෙම පෘතුගීසි මුර කපොලු ආරක්ෂා කිරීමෙන් පැහැදිලි වන්නේ පෘතුගීසි විරෝධී සටන සඳහා සිංහලයන් මැනවින් සංවිධානය වී ඇති බවයි. ක්‍රි.ව. 1587 ජුලි 19 දින රාජසිංහ හමුදාව විසින් මාපන දොරටුව ප්‍රදේශයෙන් ආක්‍රමණයක් එල්ල කළේය. රජුගේ සිය පෞද්ගලික හමුදාව වූ අතපත්තු හමුදාවේ නායකත්වය යටතේ මේ අක්‍රමණය සඳහා 6000 ක පමණ බල සේනාවක් ඇතුන් පෙරටු කොට ගමන් ගත්තේය. එසේම 300 ක අත්තුවක්කු හමුදාවක්, 1000 ක පලිහක්කාර හමුදාවක් 2000 ක් පමණ ලන්ස හමුදාක් වශයෙන් සේනා කණ්ඩායම් යැවීය. එසේම කනහර (canahara) නැමැත්තාගේ නායකත්වය යටතේ 5000 ක තවත් හමුදා බලඇණියක් මේ සඳහා එකතු විය. මෙම සටනේදී මුදලිවරු තිදෙනෙකු යටතේ කොටස් තුනකින් ඇත් හමුදාව සකස් වූ අතර ඒ අනුව සාන්ත මිගෙල්, සාන්ත ගොන්සාලෝ, සාන්ත ප්‍රැන්සිස්කු නැමති මුරපොලවලට පහර දුන්හ(Couto, 1993 : 308). ඇතුන් මඟින් රාජසිංහ විසින් විටින් විට තාප්පය බිඳීම සඳහා ප්‍රහාර එල්ල කළේය(Couto, 1993 : 308). අවස්ථා 3 කට කඩා සිංහල හමුදාව මේ පහරදීම කළ අතර තුන්වන අවස්ථාවේ සිංහල හමුදාව පැය දෙක හමාරක් පමණ (අඩහෝරාවක්) නොකඩවා පහර දි තාප්පයට දරුණු ආලහ සිදු කළහ. එහෙත් සවස් වූ බැවින් රාජසිංහ විසින් සිංහල සේනාවට පසු බැසීමට නියම කළ අතර එය පෘතුගීසීන්ට මහත් අස්වැසිල්ලක් විය. ජුලි මාස 19 දින සිදු වූ මෙම සටනින් සිංහල සෙබළුන් 400 හා ඇතුන් 2 ක් ද මළ අතර සෙබලුන් 2000 ක් පමණ තුවාල ලද බව ද වාර්තා වේ.

සටන් උපක්‍රමයක් වශයෙන් සතුරාගේ යුධ උපකරණ මධස්ථාන විනාශ කිරීම සඳහා රාජසිංහ රජු කටයුතු කරමින් සාන්ත ප්‍රැන්කානු දේව මධ්‍යස්ථානය අසළ පිහිටි පෘතුගීසි යුධෝපකරණ මධස්ථානය වැනසීම සඳහා ක්‍රි.ව. 1587 අගෝස්තු 20 දින නැව් හමුදාවක් යෙදවුනු අතර එය අසාර්ථක වූ බව කුතෝ වාර්තා කරයි(Couto, 1993 : 324). මෙහි දී සැලකිල්ලට බඳුන් කළ යුත්තේ මෙම ප්‍රයත්නය ව්‍යර්ථ වීම නොව සිංහලයන් සතුරන්ගේ යුධ උපකරණ මධ්‍යස්ථානය පහර දීම සඳහා කරන ලද ප්‍රයත්නයයි. යුද්ධයකදී යුධ බලය අඩාල කිරීම සඳහා යොදා ගත හැකි ප්‍රබල ම සාධකයක් ලෙස යුධෝපකරණ මධ්‍යස්ථානයන්ට පහරදීම සලකනු ලැබේ. එසේ තවත් උපක්‍රමයක් ලෙස මාපනේ දොරටුව අසළ පිහිටා තිබුණු පෘතුගීසි ලිඳට වස දැමීම සඳහා රාජසිංහගේ හමුදා උත්සාහ කරනු ලැබුව ද ඉන් අපේක්ෂා කළ ප්‍රතිඵල අත් නොවුණි.

ක්‍රි.ව. 1587 අගෝස්තු 23 දින විසුරේ විසින් එවන ලද යුධ හමුදා කොළඹට පැමිණීම නිසා පෘතුගීසි යුද ශක්තිය තීව්‍ර වූ අතර ප්‍රතිකාලුන් ශාන්ත සෙබස්තියන් මුර කුළුණ අසළ රැදී සිටිමින් රාජසිංහ හමුදාවට ප්‍රහාර එල්ල කිරීම නිසා ඉන් ලාංකික සෙබළුන් 30 ක් මරණයට පත් වූ අතර පෘතුගීසි ජාතික පර්නාඕ ද ලිමා මරණයට පත් වීම හේතුවෙන් පසු බැසිමට සිදු විය(Couto, 1993 : 333). සෙබළුන් 250 ක් හා නැව් 7 ක් ක්‍රි.ව. 1587 සැප්තැම්බර් 15 දින නැවත කොළඹට ගොඩ බැසිමෙන්(Couto, 1993 : 335) පැහැදිලි වන්නේ සිංහලයන් මහත් වූ රණකාමීත්වයෙන් යුක්තව තියුණු සටනක් දියත් කර ඇති බවයි. ගැටුමෙන් රාජසිංහ හමුදාවේ නැව් 4 ක් විනාශ වූ බව සඳහන් වීමෙන් පැහැදිලි වන්නේ නාවික ශක්තිය ශ්‍රී ලාංකිකයන් සටන් ජයග්‍රහණය සඳහා භාවිතා කළ බවයි(Couto, 1993 : 335). විසුරේ විසින් මනුවෙල් සූසා කුතිඤ්ඤෝගේ නායකත්වය යටතේ ක්‍රි.ව. 1588 පෙබරවාරි 4 වැනි දින ශ්‍රී ලංකාවට නැව් 18 ක බල ඇණියක් හා 600 ක් පමණ නාවික හා පාබල හමුදා ශක්තියක් යෙදවීම සඳහා පෘතුගීසීන් ක්‍රියා කිරීමෙන් පැහැදිලි වන්නේ ඒ වන විට රාජසිංහ රජු ඇතුළු සිංහල හමුදාවේ බලය ප්‍රබල වූ බවයි. ලාංකික හමුදාවේ සෙබළුන් 5000 ක්, නගර 5 ක් හා ගම් රැසක් පෘතුගීසීන් විනාශ කළේය. පෘතුගීසි සෙබළුන් 24 ක් ද ලස්කිරිඤ්ඤ බටයන් 80 ක් ලිංවලට වස දැමීම නිසා 500 කට වැඩි දේශියන් පිරිසක් ද මළ බව කුතෝ සඳහන් කරයි(Queyros, 1930 : 438).

යුධ ශිල්පයෙහි අතිශය දක්ෂයකු වූ රාජසිංහ විසින් නැවතත් කොළඹ කොටුව වටලා සතුරු පෘතුගීසීන්ට කොටුවෙන් බැහැර යාමටවත් ඊට ඇතුළු වීමටවත් ඉඩ නොදෙමින් දරුණු යුද්ධයක් ඇති කළ ද පෘතුගීසීන්ගේ නාවික ආධාර ලැබීම නිසා පෘතුගීසීන් මුළුමනින් ම පරාජය කිරීමට රාජසිංහයන්ට නොහැකි විය. පෘතුගීසීන්ට ලැබුණු නාවික ආධාර නතර වුණි නම් හෝ ලාංකික සේනාවන්ට එවැනි යුධ ආධාරයක් ලැබුණි නම් හෝ පෘතුගීසීන්ට දරුණු පරාජයක් අත් වීමට ඉඩ තිබුණි. පෘතුගීසීන්ගේ ප්‍රබල නාවික ශක්තිය හමුවේ ඊට ප්‍රතිචාර දැක්විය හැකි තරමේ විදේශීය හමුදාවකගේ සහාය රාජසිංහ රජුට නොපැවතීම, සිය පියා විසින් අනුගමනය කළ විදේශීය සම්බන්ධතා එලෙසින් හෝ වර්ධනීය ලෙසින් පවත්වා ගෙන යාමට රාජසිංහ සතු වූ අපොසත්කම පැහැදිලි කරයි.

අභ්‍යන්තර ප්‍රදේශ අධිපතීන්ගේ කැරළිකාරි තත්ත්වය විදේශිය සතුරන්ට විරුද්ධව යුධ කටයුතු මෙහෙවීමට ලාංකිකයන් දුර්වල කළ සාධකයක් විය. මේ අනුව මෙතෙක් කල් පෘතුගීසී මුහුදුබඩ ප්‍රදේශවලට වරින් වර සිදු කළ පහරදීම්වලින් ඔබ්බට ගොස් සිංහල සේනාව දුර්වල වීම පදනම් කොට ගෙන බියගම කඳවුර සහමුලින්ම විනාශ කළහ. මේ නිසා රාජසිංහ සත්කෝර්ළයට පහරදීම අත් හැරිය ද යළි ක්‍රි.ව.1592 උඩරටට යැවූ සේනාවක් ගෙන්වා ගෙන සත්කෝර්ළයට පහර දුන්නේය. මේ අතර කොළඹ කොටුවේ

සිට පෘතුගීසීහු පැමිණ බියගම හා කඩුවෙල පිහිටි ලාංකිකයන්ගේ කඳවුරුවලට පහර දුන්හ. මෙයින් කුපිත වූ රාජසිංහ රජු එම කඳවුරුවල නායකයන්ගේ හිස ගසා දැමීය. මෙයින් නොනැවති සත්කෝරළේ සෝතුපාල බණ්ඩාරයන්ට විරුද්ධව රාජසිංහ සේනා යෙදවූව ද එමඟින් ලාංකික හමුදාවන්ට අලාභ සිදු විය(Queyros, 1930 : 443-444). මේ අතරතුර උඩරට ප්‍රදේශය පාලනය කළ ජයවීර රජු රාජසිංහ රජුට විරුද්ධව සතුරු වී කැරැල්ලක් ඇරඹීය(මහාවංසො, 2005 : 2/21). ඒ අනුව රාජසිංහ උඩරට ප්‍රදේශයට පැමිණ ජයවීර පරාජය කොට ඔහු එළවා දමා වීරසුන්දර නම් කුමාරයකු(මහාවංසො, 2005 : 3/22) පත් කළ ද ඔහු ද හැම අතින් ම රාජසිංහ හා විරුද්ධ වීම නිසා උපායමාර්ගිකව රාජසිංහ විසින් වීරසුන්දරව මරා දමනු ලැබීය. උපාය මාර්ගය වූයේ වලගම වට්ටාරම ලබා දෙන්නේ යැයි පවසා වීරසුන්දරව ගෙන්වාගෙන වික්‍රමසිංහ මුදලි හා සෙනවිරත් මුදලි යන රජුගේ ප්‍රධාන සේනාපතියන් දෙදෙනා යවා ගොල්ලෑබොක්ක වීදියේ බොරුවලක දමා වීරසුන්දර බණ්ඩාර මරා දැමීම ය. වීරසුන්දරගේ පුත් කොනප්පු බණ්ඩාර(මහාවංසො, 2005 : 3/24) මේ සම්බන්ධයෙන් රාජසිංහ රජු කෙරෙහි උරණ වීම නිසා දොන් ජුවන් පෙරිය බණ්ඩාර සමීපයේ වාසයට පැමිණි ක්‍රිස්තියානි ආගම වැළඳ ගෙන දොන් ජෝන් නමින් ප්‍රසිද්ධියට පත් විය. මේ වන විට උඩරටින් පැනගිය ජයවීර තම දියණිය සමඟ මන්නාරම් පළාතේ පෘතුගීසීන් සමීපයට ගොස් ක්‍රිස්තියානි දහම වැළඳගෙන තමා දොන් පිලිප් නාමයෙන් හඳුන්වා දෙමින් සිය දියණිය දෝන කත්‍රිනා නමින් බෞතීස්ම කරවීය. මේ කාලයේ පෘතුගීසීන් සතු වූ කොළඹ ආසන්න සුළු ප්‍රදේශයක් හැරෙන්නට උඩරට හා පහතරට යන දෙරටෙහි ම රජු බවට රාජසිංහ තම බලය වර්ධනය කරගෙන තිබුණි. මෙකල දුර්වල බුද්ධියකින් යුක්ත වූ ඇතැම් කුමාරවරුන් හා භික්ෂූන් රාජද්‍රෝහි ලෙස ක්‍රියා කරමින් රජුගේ හිත දූෂ්‍ය කිරීමට ක්‍රියා කළ බැවින් හා රජුට විරුද්ධ ඔවුන් විසින් සමහර ප්‍රදේශවල ඇති කරන ලද ව්‍යාකූලතාවයන් නිසා රජු විසින් බොහෝ භික්ෂූන් වහන්සේලා මරවා, පොත් පත් ගිණි තබා, චෛත්‍යාරාමාදිය විනාශ කරමින්, භික්ෂූන් විසින් පාලනය කරන ලද ශ්‍රී පාද පර්වතය අන්‍ය භක්තික බ්‍රාහ්මණයන්ට පවරා දෙනු ලැබීය(මහාවංසො, 2005 : 3/29-32). රජුගේ මෙම උන්මත්තක ක්‍රියා කලාපයෙන් රජු කෙරෙහි කළ කිරුණු ලාංකික සිංහලයන් රටේ සතුරු පක්ෂය වූ පෘතුගීසීන් සමඟ අත්වැල් බැඳ ගත් අතර එමඟින් මනා ප්‍රයෝජන ගත් පෘතුගීසීන් සිංහලයන් සමඟ කතිකාකොට ගෙන යුධ සෙනඟක් සහිතව උඩරට පැමිණ මහනුවර පළාත ම අල්ලාගෙන දොන් පිලිප් රජ බවට(මහාවංසො, 2005 : 3/35) පත් කල ද දොන් ජෝන් නමින් ප්‍රසිද්ධ වූ කොනප්පු බණ්ඩාරපිලිප් රජු මරා රජ විය(මහාවංසො, 2005 : 3/37). මෙයින් උරණ වූ පෘතුගීසිහු මන්නාරමේ මේ වන විට වාසය කළ දොන් ජෝන් මේලෝ නම් සෙනෙවියාගෙන් ආධාර ඉල්ලා සිටි අතර මෙය දැනගත් කොනප්පු බණ්ඩාර උඩරට සිටි සියලු පෘතුගීසීන් ඒ ප්‍රදේශයෙන් පන්නා දැමීය.

රාජසිංහ රජු පාදාබාධයකින් ටික දිනක් පීඩනයට පත් වී සිට අවුරුදු 100 කට වැඩි කලක් ආයු වළඳා මිය ගියේය(මහාවංසො, 2005 : 3/51). සීතාවක රාජසිංහගේ මරණින් පසුව පෘතුගීසීන්ගේ යටත්විජිත ව්‍යාපාරය වඩාත් පහසුවෙන් ගෙන යා හැකි විය. රාජසිංහයන්ගේ මරණය පමණක් නොව දේශීය නායකයන් අනුගමනය කරන ලද තම ස්වාධීනත්වය සම්බන්ධයෙන් සැලකිල්ල අවම වීම මෙම තත්ත්වය කාර්යක්ෂම කරවීමට හේතු සාධක සැපයීය. රාජසිංහගේ මරණින් පසු ක්‍රි.ව. 1594 පෙබරවාරි මස 26 දින මලබාරයේ ප්‍රධාන කපිතාන් වූ දොන් ජෙරනිමෝ ද අසවේදූගේ නියෝග අනුව දොන් ජුලියන් ද නොරෙඤ්ඤෝ යුධෝපකරණ හා හමුදාව රැගෙන ශ්‍රී ලංකාවට පැමිණි අතර ඒ වන විට මහබිසෝ බණ්ඩාරගේ බාල පුතු රජකමට පත් වී සිටියේ ය. මේ වන විට ජයවීර නොසලකා හරිමින් ලාංකිකයන් කටයුතු කිරීම නිසා ජයවීර පෘතුගීසි පක්ෂය ගෙන හමුදා 3000 ක් පමණ ලබාදෙමින් පෘතුගීසීන්ට උදවු සැපයීම කරණ කොටගෙන පෘතුගීසීන්ගේ යටත්විජිත ව්‍යාපාරය සාර්ථක විය. කඩුදෙවොල සහ මල්වාන යන ස්ථාන ජයවීර බණ්ඩාර විසින් අල්ලා ගත්තේය. මේ අවස්ථාවේ කපිතාන්වරු හා සෙබළු ගුරුබැවිල බලකොටුව අසළ දී ජයවීරගේ හමුදාවට එක් වී එය තුන් පැත්තකින් වට කර පහර දී 900 ක් පමණ සිර භාරයට ගත්හ. මේ අනුව මහබිසෝ බණ්ඩාර සහ නිකපිටිය බණ්ඩාර ඌවට පසු බැස්සහ. සීතාවක ජයවීර බණ්ඩාර විසින් ධර්මපාල කුමරුට දිනා දුන්නේය. ලක්දිව තුළ පෘගීසින්ගේ බල පරාක්‍රමය වැඩි වශයෙන් රැඳීමට උපකාරී වූයේ පෘතුගීසි සතු වූ නාවික ශක්තියයි. ගොඩබිමින් සිදු වූ සටන්වලදී සිංහලයන් සාර්ථක වුව ද කොළඹ වැටලීම සඳහා කෙරුණු සටන් දෙක ම බලාපොරොත්තු වූ තරමින් ප්‍රතිලාභ ළඟා කර ගත නොහැකි වූයේ ගෝවේ සිට එවන ලද ආධාර නතර කරලීමට මගක් ලාංකිකයන්ට නොතිබූ බැවිනි.

**සමාලෝචනය**

යුද්ධය ප්‍රායෝගික තත්ත්වයකි. එහෙයින් න්‍යායික මූලධර්ම මත පමණක් විශ්වාසය තබා යුධ සැලසුම් සකස් කළ නොහැක. යුද්ධය සම්බන්ධයෙන් න්‍යායික භාවිතය, මූලධර්ම ප්‍රයෝජනයට ගත යුතු වුව ද ඒ මුළුමනින් ම නොවේ. පෘතුගීසි ආක්‍රමණිකයන්ට විරුද්ධව යුධ මූලධර්ම මත පමණක් පිහිටා රටේ පාලකයා ඇතුළු සටන්කරුවන්ට යුධ වැදිය නොහැකි විය. පෘතුගීසීන්ගේ නව තාක්ෂණික මෙවලම් හා යුධ තාක්ෂණය මත ලාංකිකයන්ට තම යුධ සැලසුම් වෙනස් කිරීමට සිදු විය. ඒ අනුව ලාංකික සටන්කරුවෝ න්‍යායික භාවිතයට වඩා ප්‍රායෝගික යුධ භාවිතය පිළිබඳ අවධානය යොමු කළහ. පළමු වන රාජසිංහ රජු විසින් සීතාවක යුගයට පූර්වයේ නොවූ නව යුධ සැලසුම් හා උපක්‍රම ප්‍රථමවරට පෘතුගීසීන් පැමිණීමෙන් පසු අත්හදා බලන ලද්දේ විය. මුලේරියා

සටන ජයගැනීමත්, ඉතා ප්‍රබල හානි සිදු කරමින් කොළඹ කොටුව දෙවරක් වැටලීමත්, පැරණි යුධ ක්‍රම, අවි ආයුධ භාවිතය මෙන් ම, නව යුධ උපක්‍රම අත්හදා බැලීමේ ප්‍රතිඵලයන් විය. රාජසිංහ රජුගේ ක්‍රියාකාරිත්වය දුර්වල වීමටත් පෘතුගීසි බලය තහවුරු වීමටත් හේතු වූයේ ලංකාවේ පැවති වියවුල්කාරී දේශපාලනයත්, නාවික යුධ බලය හා නවීන යුධ තාක්‍ෂණික මෙවලම් නොතිබීමත් හේතු කොටගෙන බව හඳුනාගත හැක. පාලකයා බෙහෙවින් ම රටේ ජාතික ආරක්‍ෂා තහවුරු කරලීම පදනම් කරගනිමින් රට මෙහෙයවීමත් රටේ ජනතාව ඒ සඳහා වූ පූර්ණ අනුගත වීමත් පැරණි ශ්‍රී ලංකාවේ යුධ ප්‍රතිපත්තිය විශ්ලේෂණයෙන් වර්තමානයට ගලපාගත හැකි මාර්ගෝපදේශයකි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අමරසිංහ,රිස්මන්. (1998). *සීතාවක රාජධානියේ උන්නතියේ හා අවනතියේ සමහර අංශ පිළිබඳ විමර්ශනයක්.* කර්තෘ ප්‍රකාශන.

ගම්ලත්, සුචරිත. (2009). *ඉංග්‍රීසි සිංහල මහා ශබ්ද කෝෂය(පළමු වෙළුම).* සංහිඳ ප්‍රකාශන.

කරුණාරත්න,ඒ.එම්. (2008). *විදේශීය ආක්‍රමණ හා විමුක්ති සටන්.* දයාවංස ජයකොඩි සහ සමාගම.

මහාවංසො තතියෝ භාගො(පරිසිට්ඨසඞගහො). (2005). *යගිරල පඤ්ඤානන්දාභිධාන නායක ථෙර.* සමයවර්ධන සමාගම.

මූණමලේ ඤාණරතන, මූණමලේ සෝමවංස, සහ සෝමපාල, ඒ.පී. (1975). *මානියම් ගම රජමහා විහාරේ ඓතිහාසික තොරතුරු.* කැලණිය.

රායහේමචන්ද්‍ර, සහ පරණවිතාන ඇතුළු පිරිස. (1964). *ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, පළමුවන කාණ්ඩය. පළමු භාගය.* විද්‍යාලංකාර විශ්වවිද්‍යාල ප්‍රකාශන.

ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය(ප්‍රථම භාගය හා ද්විතීයික භාගය). (වර්ෂය සඳහන් නැත). *වැලිවිටියේ සෝරත හිමි.* එස් ගොඩගේ සහ සහෝදරයෝ.

සුරවීර, ඒ.වී (Ed.). (1976). *රාජාවලිය.* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

De Queyros, Padre Fernão., 1930. *The temporal and spiritual conquest of Ceylon*, translated by S.G. Perera, vol I-III. Colombo; A.C.Richeards publication.

Burnell, A.C., and Tiele, P.A(ed)., 1885. *The Voyage to John Huyghen Van Linschoten to The East Indies*.Vol. I. London.

Fernwndo A, Denis, 1973. *The Ground Water Resources of SriLanka.* Colombo.

Barros João de and Couto, Diogo do., 1993. *The History of Ceylon, from the Earliest Times to 1600 A.D.* Donald Ferguson(tr.). Colombo: Navrang in collaboration with Lake House.

Pieris, P.S., 1983. *Ceylon: the Portuguese Era being a History of the island for the period(1505- 1658)* vol.2. Colombo: Tisara Prakasakayo.

Pieris, P.E and Fitzler, M., 1927. *Ceylon And Portugal, King And Christians 1539-1552*. part 1. verlag der asia Major. Leipzig.